කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOM E3063 - බදුකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

01. ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු වන කාංචන රණතුංග මහතා විසින් 2011/2012 තක්සේරු වර්ෂය සඳහා තම ලාභ සහ ආදායම් පිළිබඳ පහත විස්තර ඔබට සපයන ලදී.

1) ව්‍යාපාර ලාභය

අ. 2012 මාර්තු 31 න් අවසන් වන වර්ෂය සඳහා ඔහුගේ තනි පුද්ගල ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 13,850,000 කි.

ආ. 2012 මාර්තු 31 දිනට දේපල පිරියත හා උපකරණ සම්බන්ධ තොරතුරු

| කාණ්ඩය | පිරිවැය (රු) | අත්පත් කරගත් / ඉදිකල වර්ෂය | සටහන් |
|---|---|---|---|
| ඉඩම් | 20,000,000 | 2004/2005 | |
| ගොඩනැගිලි | 34,000,000 | 2007/2008 | |
| මෝටර් වෑන් | 65,000,000 | 2008/2009 | කල්බදු වත්කමකි. (එකතු කල අගය මත බදුහැර වර්ෂ 5ක් සඳහා මාසික වාරිකය රු. 1,267,500 කි.) |
| ලීබඩු | 900,000 | 2008/2009 | |

ඇ. ව්‍යාපාරය වර්ෂය තුල කල්බදු වාරික ගෙවා ඇත්තේ මාස එකොලහක් (11) ක් සඳහා පමණි.

ඉ. වර්ෂය තුලදී රු. 12,000ක් වටිනා විධායක මේසයක් (2007/2008 වර්ෂයේ මිලට ගෙන, ලී බඩු තුල ඇතුලත්ව තිබූ ) රු. 10,000 කට විකුණන ලද අතර ගිණුම් තුල නියමිත ලෙස අවශ්‍ය සටහන් තබන ලදී. විකිණීමෙන් ලද ගිණුම්කරන ලාභය රු. 5,000 කි.

ඊ. වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී පහත වියදම්ද දරා ඇත.

i. වැටුප් - රු. 230,000 (ව්‍යාපාරයට සේවය සැපයීම වෙනුවෙන් බිරිඳට ගෙවූ රු. 36,000 ද ඇතුලත්ව)

ii. ප්‍රචාරණය - රු. 15,500

iii. ගමේ පන්සලට කළ පරිත්‍යාගය - රු. 1,500

iv. ක්ෂය - රු. 14,850,000

v. ඉන්ධන - රු. 20,000

vi. ණය ගැතියන්ට එරෙහි නඩුවකට ගෙවූ නීතිඥ ගාස්තු - 10,000

vii. සේවක සුභසාධන - රු. 12,000

2) කුලී ආදායම.

2009/2010 තක්සේරු වර්ෂය තුලදී ඔහු විසින් ඔහුගේ එක් නිවසක් නේවාසික ඒකක බවට පරිවර්තනය කල අතර පළාත් පාලන අධිකාරිය මගින් එක් එක් ඒකකය වෙන වෙනම තක්සේරු කරන ලදී. වරිපනම් 30% කි.

| ඒකකය | බිම් වපසරිය (වර්ග අඩි) | මසකට දළ කුලිය (රු) | තක්සේරු වටිනාකම (රු) |
|---|---|---|---|
| 1 | 2200 | 45,000 | 120,000 |
| 2 | 1300 | 15,000 | 65,000 |
| 3 | 900 | 10,000 | 20,000 |

3) ලද පොළි ආදායම්

| | රු. |
|---|---|
| ස්ථාවර තැන්පතු මත | 14,500 (ශුද්ධ) |
| ඉතුරුම් ගිණුම් මත | 3,450 (දළ) |
| ඔහුගේ වයස අවු : 10 වන | |
| දියණියගේ ඉතුරුම් ගිණුම මත | 2,760 (දළ) |

4) ලාභාංශ ආදායම

ඔහු විසින් පබලු සීමිත පොදු සමාගමේ කොටස් මත ආයෝජනය කල අතර රු.20,000 ක් ලාභාංශ ලෙස ලබන ලදී. මෙම ලාභාංශ ගෙවන ලද්දේ වෙනත් සමාගමක් ඔවුන්ට ගෙවන ලද ලාභාංශ මගිනි.

5) වර්ෂය තුල කල අනෙකුත් ගෙවීම්.

i. වෛද්‍ය රක්ෂණ වාරිකය - රු. 120,000

ii. නිදන් ගත රෝගයක් වෙනුවෙන් සෞඛ්‍ය රක්ෂණ වාරිකය - රු. 240,000

iii. ව්‍යාපාරය සඳහා ගොඩනැගිල්ලක් සෑදීමට ලබා ගත් ණයක් වෙනුවෙන් කල පොලි ගෙවීම් - රු. 50,000

ප්‍රාග්ධනය පියවීම - රු. 235,000

iv. බිම් කුලී - රු. 35,000

v. ස්වයං තක්සේරු පදනම මත බදු ගෙවීම් - රු. 120,000

vi. ව්‍යාපාර ප්‍රාග්ධන සමාගමක කොටස් වල ආයෝජන - රු. 500,000

2011/2012 තක්සේරු වර්ෂය සඳහා කාංචන රණතුංග මහතාගේ ගෙවිය යුතු අවසන් ආදායම් බද්ධ ඔබ විසින් ගණනය කළ යුතුය. (එකතු ව්‍යවස්ථාපිත ආදායම, තක්සේරු ආදායම සහ බදු අයවන ආදායම ගණනය කිරීම් වෙන වෙනම පෙන්විය යුතුය)

(මුළු ලකුණු 30)

02. 2011 ඔක්තෝම්බර් 01 දින රැකියාවෙන් විශ්‍රාම ගත් ඔබගේ මිතුරෙකු වන රුවන් දිසානායක මහතා ඔහුගේ 2011/2012 තක්සේරු වර්ෂයට අදාලව සේවානියුක්ති ආදායමට සහ විශ්‍රාම ප්‍රතිලාභයන්ට අදාල තොරතුරු ඔබට සපයා ඇත.

<u>සේවානියුක්ති ආදායම</u>

වැටුප් - රු. 65,000 (මාසිකව)

දීමනා - රු. 35,000 (මාසිකව)

නිවාඩු දීමනා - රු. 20,000

සංග්‍රහ දීමනා - රු. 15,000 (මාසිකව)

විදුලි බිල් ප්‍රතිපූරණය - රු. 12,000

දුරකථන බිල් ප්‍රතිපූරණය - රු. 9,000

රියදුරු සහ ඉන්ධන සහිතව මෝටර් රථයක් ( 2500 cc )

අඩුකිරීම් - සේවක අර්ථසාධක අරමුදල - රු. 55,200

- උපයන විට ගෙවීම් - රු. 15,600

<u>විශ්‍රාම ප්‍රතිලාභ</u>

පාරිතෝෂික - රු. 7,800,000

සේවක අර්ථ සාධක අරමුදල

- සේව්‍යයාගේ දායකත්වය - රු. 955,000

- සේවකයාගේ දායකත්වය - රු. 650,000

- ආයෝජන ආදායම - රු 210,000

සේවක භාරකාර අරමුදල

- දායකත්වය - රු. 240,000

- ආයෝජන ආදායම - රු. 50,000

අවසාන වසර තුනෙහි සාමාන්‍ය මාසික වැටුප රු. 55,000 ක් විය. ඔහුට වසර 35 ක සේවා කාලයක් ඇත.

<u>වසර තුල කල විශේෂ වියදම්</u>

- අපි වෙනුවෙන් අපි අරමුදල සඳහා පරිත්‍යාග - රු. 45,000

- ඉඩමක් මිලදී ගැනීමට ගත් ණයක් වෙනුවෙන් පොලි ගෙවීම් - රු. 15,000

ප්‍රාග්ධන පියවීම් - රු. 20,000

- උසාවි තීන්දුවක් මත බිරිඳට ගෙවන වාර්ෂික - රු. 240,000

2011/2012 තක්සේරු වර්ෂය සඳහා රුවන් දිසානායක මහතාගේ අවසන් බදු වගකීම ගණනය කරන්න.

(මුළු ලකුණු 30)

03. මහනුවර නේවාසිකයෙකු වන ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු මහතා සතුව බණ්ඩාරවෙල ගෘහභාණ්ඩ සහිත බංගලාවක් ඇති අතර ඔහු එය වසරකට මාස තුනක් පරිහරණය කරයි. එක් මාසයක් පිරිසිදු කිරීම් කටයුතු සඳහා වෙන් කර තබන අතර ඉතිරි මාස අට (08) තුල මසකට රු. 6,000 බැගින් කුලියට දෙන ලදී. බණ්ඩාරවෙල නගර සභාව මගින් කල තක්සේරු අගයට අනුව කුලි අගය රු. 45,000 ක් වූ අතර වාර්ෂික අගය මත වරිපණම් 20 % ක් ගෙවන ලදී. රු. 3,000 ක් කොමිස් ලෙසද , රු. 2,500 ක් ගෘහභාණ්ඩ නඩත්තු ලෙසද වියදම් කරන ලදී.

ප්‍රනාන්දු මහතාට අදාල ආදායම් ප්‍රභවයන් ගණනය කරන්න.

(මුළු ලකුණු 15)

04. අ. 2011/2012 තක්සේරු වර්ෂය සඳහා නුවන් බණ්ඩාර මහතාගේ ආදායම් බදු වගකීම රු. 850,000 කි. 2010/2011 වර්ෂය සඳහා මෙය රු. 750,000 ක් විය.

දණ්ඩනයන්ගෙන් මිදිම සඳහා ස්වයං තක්සේරු ක්‍රමය යටතේ නුවන් බණ්ඩාර මහතා විසින් කාර්තු පදනම මත ගෙවිය යුතු බදු නියමිත දිනයන් සහිතව සඳහන් කරන්න.

(ලකුණු 05)

ආ. ප්‍රධාන ආදායම් බදු මුලධර්ම හතර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 15)

05. පහත සඳහන් දෑ පැහැදිලි කරන්න.

අ. දරුවා

ආ. පුද්ගලයා

ඇ. බදු බැර

ඉ. නිර්නේවාසිකයා

ඊ. තක්සේරු වර්ෂය

(මුළු ලකුණු 10)